සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
**Department of Divineguma Development**

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, **Sethsiripaya ,Battaramulla**

මගේ අංකය / எனது இல / My No: DDD/HO/06/MA/01 /2016

ඔබේ අංකය / உமது இல / Your No: ..............................

දිනය / திகதி / Date: 2016.06.08

**දිවිනැගුම චක්‍රලේඛ අංක :- 2016/09**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්

## දිවිනැගුම අලෙවි සංවර්ධන වැඩසටහන - 2016

ජාතික වෙළඳපොල තුළ **"ජනහිතකාමී ව්‍යාපාරික ප්‍රජාවක්"** බිහිකිරීම ප්‍රධාන අරමුණ කරගත් 2016 වර්ෂයේ අලෙවි සංවර්ධන වැඩසටහන ප්‍රධාන අංශ 07 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සැළසුම් කර ඇත.

ග්‍රාම නිලධාරි වසම් දක්වා දිවයින පුරා විසිරි සිටින දිවිනැගුම කාර්ය මණ්ඩලයේ හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඇතිව දිවිනැගුම (සමෘද්ධි) ව්‍යාපාරික ප්‍රජාව සඳහා ජාතික මට්ටමේ ව්‍යාපාරික ජාලයක් බිහිකිරීම සඳහා කටයුතු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ මූලික අරමුණක්ව තිබේ. ඒ සඳහා පහත වැඩසටහන් ඔබ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ඔබගේ කාරුණික සහයෝගය අපේක්ෂා කරමි.

### ප්‍රධාන වැඩසටහන්

1. දිවිනැගුම ව්‍යාපාරික සංගම් ආරම්භ කර ලියාපදිංචි කිරීම
2. දිවිනැගුම නිෂ්පාදන අලෙවි ආදර්ශ ගම්මාන ආරම්භ කිරීම
3. දිස්ත්‍රික් දිවිනැගුම අලෙවි මධ්‍යස්ථාන ආරම්භ කිරීම
4. ගෘහස්ථ ගබඩා පහසුකම් අවශ්‍ය පරිදි සපයාදීම
5. ජංගම අලෙවි පහසුකම් සඳහා අවස්ථා ලබාදීම
6. අලෙවිකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
7. දිවිනැගුම නිෂ්පාදන අලෙවිය සඳහා ප්‍රචාරණ කටයුතු වර්ධනය කිරීම.


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722(Hotline)** |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

## 01. දිවිනැගුම ව්‍යාපාරික සංගම් ස්ථාපිත කිරීම.

2015 වසරේ ඔබ වෙත ලබාදුන් උපදෙස් පරිදි ප්‍රාදේශිය දිවිනැගුම ව්‍යාපාරික සංගම් පිහිටුවීම අවසන් කර ඇති අතර, එම ව්‍යාපාරික සංගම් වල ඉදිරි කටයුතු සඳහා සකස් කරන ලද ව්‍යවස්ථාවේ කෙටුම්පත ඇමුණුම 02 හි සඳහන් වේ. එහි සඳහන් උපදෙස් අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපාරික සංගමයේ ක්‍රියාකාරිත්වය ආරම්භ කිරීමට පියවර ගතහැකි අතර සෑම කොට්ඨාසයක් සඳහාම රුපියල් 60,000/- ක උපරිමයකට යටත්ව මුදල් ප්‍රතිපාදන වෙන් කර දෙනු ලැබේ. මෙම ප්‍රතිපාදන පහත පරිදි භාවිතා කිරීමට හැකියාව ඇත.

- (මහ සභාවේ) ව්‍යාපාරික සංගමයේ සමාරම්භක කටයුතු සඳහා
- ලිපි ද්‍රව්‍ය
- ලියාපදිංචි කටයුතු සඳහා
- මූලික පුහුණුව/ වෙනත් අවශ්‍ය පුහුණු සඳහා ( තම සංගමයේ සාමාජිකයින්ගේ දැනුම වර්ධනය කළයුතු ක්ෂේත්‍ර හඳුනාගෙන පුහුණු වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගත යුතුය.)

## 02. දිවිනැගුම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක වන පරිසර හිතකාමී ආදර්ශ ගම්මානවල අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

පරිසර හිතකාමී ආදර්ශ ගම්මානවල අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ ඉහත වැඩසටහන සඳහා තෝරා ගන්නා ගම්මානවල දිවිනැගුම නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළෙඳපොල පුළුල් කිරීම මෙන්ම ඔවුන්ගේ ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කිරීමේ අරමුණ ඇතිව මෙමවැඩසටහන ක්‍රියාත්මක වේ. එහිදි තම නිෂ්පාදන අලෙවිකර ගැනීමට පවතින දුෂ්කරතා හඳුනා ගැනීම හා ප්‍රමුඛතාවය අනුව පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කෙරේ.

<u>ක්‍රියාත්මක වැඩසටහන්</u>

i. කෘෂිකාර්මික, කාර්මික, සත්ව පාලන හා ධීවර මෙන්ම සේවා ව්‍යාපෘති සඳහා අවශ්‍ය අලෙවි ප්‍රවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් සැපයිම.

ii. ගම්මානයේ සිදුකරන නිෂ්පාදන අනුව අලෙවි අවස්ථා පුළුල් කිරීමේ වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරිම

iii. ජාතික මට්ටමේ ව්‍යාපාරිකයින් සමග ඉදිරි වෙළෙඳ ගිවිසුම් සඳහා ඇති ඉඩ ප්‍රස්ථා හඳුනා ගැනීම හා ඒ සඳහා යොමු කිරිම

iv. නිෂ්පාදන අලෙවිය සඳහා ප්‍රචාරණය, ගබඩාකරණය, ප්‍රවාහනය, ඇසුරුම්කරණය, ප්‍රමිතිකරණය වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කර ගම්මානය තුළ අලෙවි ප්‍රවර්ධනය ඇති කිරිම

<u>මූල්‍ය ප්‍රතිපාදන</u>

**සෑම දිස්ත්‍රික්කයක් සඳහාම රු. ලක්ෂ 50ක දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වෙන්කර දෙනු ලැබේ. ඒ අනුව ආදර්ශ ගම්මානවල අලෙවි ප්‍රවර්ධනයට අවශ්‍ය සැලසුම් සකස් කර ව්‍යාපෘති වාර්තා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. ඉන් අනතුරුව ප්‍රතිපාදන නිදහස් කෙරේ.**

## 03. දිවිනැගුම අලෙවි මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.

දිවිනැගුම වැඩසටහන හා සම්බන්ධ වී සිටින කුඩා හා මධ්‍ය පරිමාණයේ නිෂ්පාදකයින්ගේ වෙළෙඳපල පුළුල් කිරීමේ ක්‍රමෝපායක් ලෙස සෑම දිස්ත්‍රික්කයකම බහුවිධ නිෂ්පාදන සහිත වූ අලෙවි මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා ස්ථානයක් තෝරාගැනිමට මගේ අංක DDD/HO/6/m/2- 07 හා 2016.05.05 දිනැති ලිපිය මගින් දැනටමත් ඔබ වෙත උපදෙස් ලබා දී ඇත. ඒ අනුව ප්‍රමුඛතා පදනම මත තෝරාගනු ලබන එක් අලෙවි මධ්‍යස්ථානයක් සඳහා මූලික වැය දැරිමක් ලෙස රු.4,000,000/- ක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන වෙන්කර දෙනු ලැබේ. මෙම මධ්‍යස්ථානය ආරම්භ කිරීමට කැමැත්ත දක්වන දිස්ත්‍රික්කවල ස්ථානීය ශක්‍යතාව පරීක්ෂා කර ව්‍යාපෘති වාර්තාව සකස් කර දිස්ත්‍රික්ක ලේකම්ගේ නිර්දේශයෙන් අලෙවි අංශයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුවේ. දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලද පසු අදාල ප්‍රතිපාදන නිදහස් කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘති වාර්තා අනුව ඉහත මූල්‍ය සීමාවන් වෙනසකට භාජනය කර ගැනීමේ අවකාශ ද ඇති අතර පාරිභෝගිකයාගේ උපරිම තෘප්තිය ලබාදිය හැකි මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට ඇති අවස්ථාව කෙරෙහි මූලික අවධානය යොමු කළයුතුය. එසේම ඉහත ප්‍රතිපාදනවලට අමතරව වෙනත් රේඛීය අමාත්‍යාංශවල වෙන් කරන ලද ප්‍රතිපාදන ද යොදා ගනිමින් වඩාත් ඵලදායී අලෙවි මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට අවධානය යොමු කිරීම මැනවි.

## 04. ගෘහස්ථ ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම.

කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන නිෂ්පාදන සිදුකරන කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින්ට ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිකම නිසාම නිෂ්පාදන අපතේ යෑම, කල්තබා ගැනීමට නොහැකිවීම මෙන්ම එම නිෂ්පාදනවලට සාධාරණ මිලක් නොලැබී යෑමේ අවධානමකට දිවිනැගුම නිෂ්පාදකයින් මුහුණ දී සිටින ප්‍රධාන ගැටලුව අවම කරලීම සඳහා පසුගිය වසරේ සුළු පරිමාණ වශයෙන් ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගත් දිස්ත්‍රික්ක සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් මෙම වසර තුළ ද ගෘහස්ත ගබඩා 200 ක් ඉදිකිරීමට දෙපාර්තමේන්තු ප්‍රතිපාදන ලබා දීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා ගබඩා පහසුකම් අවශ්‍ය තරමේ ප්‍රමාණවත් නිෂ්පාදන සිදුකරන නිෂ්පාදකයින් හඳුනාගෙන ගෘහාශ්‍රිතව ගබඩාවක් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාදිය හැකිය.

❖ **ගබඩා පහසුකම් ඉදිකිරිමට ප්‍රතිලාභින් තෝරාගන්නා නිර්ණායක**

1. ගෘහ ඒකකය තුළ ගඩබාකරණය දැනටමත් ආරම්භ කර ඇති හා තවදුරටත් වැඩිදියුණු කලයුතු හෝ පුළුල් කළහැකි ගබඩා පරිශ්‍රයක් ඇති නිෂ්පාදකයකු වීම.
2. සැලකිය යුතු අතිරේක නිෂ්පාදනයක් ඇති ගෘහස්ත මට්ටමින් ගබඩාවක් ඉදිකිරීමට උනන්දුවන හා ඒ සඳහා තම දායකත්වය 50% ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කරන නිෂ්පාදකයින් වීම.
3. ප්‍රාදේශීය නිෂ්පාදකයින්ගේ අතිරික්ත නිෂ්පාදන මිලදී ගෙන තොග රැස් කිරීමේ හා අලෙවි කිරීමේ නිරත වන දිවිනැගුම ව්‍යාපාරිකයකු වීම.
4. ගබඩාව ඉදිකරන ඉදිකිරීම් පරිශ්‍රය නිරවුල් හා ආරක්ෂිත ස්ථානයක් මෙන්ම ප්‍රවාහන දුෂ්කරතා නොමැති ස්ථානයක් වීම.

එක් ගබඩාවක් ඉදිකිරීම සඳහා අය නොකරන පදනම මත රු.100,000/- ක උපරිමයකට යටත්ව දෙපාර්තමේන්තු ප්‍රතිපාදන ලබාදෙනු ලැබේ. ගබඩාව ඉදිකිරීමේ ව්‍යාපෘති වාර්තාව ආකෘති පත්‍ර අංක 02 මගින් දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. ගබඩාව ඉදිකිරීමේදී ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීම, ජලය, විදුලිය , ගබඩාකරණයට අවශ්‍ය ඇසුරුම් උපකරණ, සඳහා වන ඇස්තමේන්තු මුදලින් 50%, දෙපාර්තමේන්තු ප්‍රතිපාදන නිර්දේශ කළ හැක. ඇස්තමේන්තුව අනුව ඉතිරි මුල්‍ය අවශ්‍යතාව සමෘද්ධි බැංකු ණය , චක්‍රිය අරමුදල හෝ තම දායකත්වය මගින් සපයා ගත යුතු වේ.

ගබඩා පහසුකම් සඳහා ප්‍රතිපාදන නිර්දේශ කිරීමේදී මුළු ඇස්තමේන්තුවට අන්තර්ගතව ඇති ඉහත අයිතමවල ඇස්තමේන්තු වටිනාකම පිළිබඳ සැලකිළිමත් විය යුතුය. මෙම ගබඩා

ඉදිකිරිමේදී ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ හා දිවිනැගුම නිලධාරීන්ගේ අධික්ෂණය හා උපදෙස් මත ගබඩාකරණයට සුදුසු පරිදි ඉදිකිරීම් නිම කිරීමට කටයුතු කලයුතු අතර කාර්මික නිලධාරීන්ගේ සුපරීක්ෂණයට හා මිණුම් වාර්තා අනුව ගෙවීම් කිරීමට සැලකිලිමත් විය යුතු වේ.

## 05. අලෙවි ප්‍රවර්ධන පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන.

- **අලෙවි ප්‍රදර්ශන**

ප්‍රාදේශිය හා දිස්ත්‍රික් අලෙවි ප්‍රදර්ශන පැවැත්වීම සඳහා කැපවීමෙන් හා උනන්දුවක් දක්වන දිස්ත්‍රික්කවල ප්‍රදර්ශන සංවිධානය කොට පැවැත්වීමට ඒ ඒ දිස්ත්‍රික්කවලට හැකියාව ඇත. ඒ සඳහා මෙම වසරේ දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වෙන් කිරිමක් නොමැති අතර අනුග්‍රාහක දායකත්වය හා ව්‍යාපාරික සංගම්වල දායකත්වය ඇතිව මෙම කටයුතු කිරීමේ හැකියාව ඔබට ඇත.

මෙම වසරේ දෙසැම්බර් මාසයේදී කොළඹදී පැවැත්වීමට සැළසුම් කර ඇති "දා බිඳු මුතු - 2016" ජාතික මට්ටමේ අලෙවි ප්‍රදර්ශනය මෙන්ම අනෙකුත් ජාතික අලෙවි ප්‍රදර්ශන සඳහා ද දිවිනැගුම නිෂ්පාදකයින් සහභාගී කරවිමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා 2015 වසරේ ඇගයීමට භාජනය වූ දිස්ත්‍රික් ව්‍යාපාරිකයන් හා මෙම වසර තුළ ප්‍රශස්ත මට්ටමක් ලබාගන්නා නිෂ්පාදයින්ට සහභාගීවීමට අවකාශ ලබාදීමට සැලසුම් කර ඇත. දිවිනැගුම නිෂ්පාදකයින්ට අමතරව ජාතික මට්ටමේ ව්‍යාපාරිකයින් සුළු සංඛ්‍යාවක් ද මෙම ප්‍රදර්ශනයට සහභාගි කරවීමට අදහස් කර ඇති බැවින්, දිස්ත්‍රික් මගින් ඉදිරිපත් කරන නිෂ්පාදකයින් ජාතික මට්ටමට හඳුන්වාදීමට අවස්ථාව උදාකර ගත යුතු වේ. එසේම මෙම වෙළඳ ප්‍රදර්ශනය පැවැත්වෙන කාල සීමාවේ ප්‍රමාණවත් නිෂ්පාදන තොග ඉදිරිපත් කිරීමට අවශ්‍ය හැකියාව ඔවුන් තුළ ඇති කිරීමට අවශ්‍ය මගපෙන්වීම් කිරීම අත්‍යවශ්‍ය වන අතර, වැඩිමනක් විස්තර පසුව දැනුම් දෙනු ලබන බව සලකන්න.

- **ජංගම අලෙවි රථ ලබාදීම හා ජංගම අලෙවි කුටි සංවර්ධනය කිරීම.**

දිවිනැගුම සන්නම සඳහන් කරමින් මෝටර් සයිකල්, ත්‍රිවීලර්, කරත්ත හා කුඩා ප්‍රමාණයේ ලොරි රථ මෙන්ම අලෙවි බක්කි, පා පැදි, ජංගම අලෙවි කුටි යනාදිය මගින් දිවිනැගුම නිෂ්පාදන පාරිභෝගික ප්‍රජාව වෙතටම ගොස් අලෙවි කිරීමට අවස්ථාව වැඩි දියුණු කිරීමේ අරමුණු ඇතිව මෙම වසරේ ජංගම අලෙවි වැඩසටහන සඳහා අංශ 02 ක් යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත.

- **මධ්‍ය ප්‍රමාණයේ ජංගම අලෙවි රථ ලබාදීම.**

මේ යටතේ එක් අලෙවි රථයක් සඳහා රු.150,000/- ක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. ජංගම අලෙවි රථ ලෙස ත්‍රීවිලර්, කුඩා ප්‍රමාණයේ ලොරි රථ, මෝටර් සයිකල් වැනි ජංගම වෙළෙඳ රථ ඉල්ලුම් කරන නිෂ්පාදකයින්/අලෙවි කරුවන් සඳහා මෙම ප්‍රතිපාදන අනුමත කිරීමට හැකියාව ඇත. එකී කුමන හෝ අලෙවි රථයක් මිලදී ගන්නා ව්‍යවසායකයා තම ප්‍රජාමූල බැංකු සංගමයේ සාමාජිකත්වය ලබා ගනුදෙනු කරන සාමාජිකයෙකු විය යුතු අතර, අලෙවි රථයක් මිලදී ගැනීමට අවශ්‍ය ඉතිරි මුදල තම දායකත්වයෙන් හෝ බැංකු ණය මගින් සම්පූර්ණ කලයුතු වේ.

- **කුඩා ප්‍රමාණයේ ජංගම රථ ලබාදීම හා අලෙවිකුටි.**

කුඩා ප්‍රමාණයේ ජංගම අලෙවි රථ ලබා ගැනීමට උනන්දුවක් දක්වන නිෂ්පාදකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා රු. 50,000./- ක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන ලබාදීමට හැකියාව ඇත. මේ යටතේ පා පැදි, කරත්ත, කුඩා අලෙවි කුටි හා අලෙවි බක්කි මෙන්ම ජංගම අලෙවි කුටි සඳහා ද මුදල් නිදහස් කිරීමට උන්නදු විය යුතු වේ. ප්‍රාදේශීය අවශ්‍යතා හා ඉල්ලීම් අනුව ප්‍රමුඛතාවය ලබා දෙමින් සුදුසු ප්‍රතිලාභින් තෝරා ගැනීම සඳහා දිස්ත්‍රික් අලෙවි හා ජීවනෝපාය කළමනාකරුගේ පූර්ණ අධීක්ෂණය හා මෙහෙයවීම සිදු කළ යුතුය. එහිදි ජංගම රථ මිලදි ගන්නා අලෙවි ව්‍යාපෘතිවල ශක්‍යතාවය තහවුරු කිරීම, සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර දිස්ත්‍රික්කය සඳහා වෙන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව හා මුදල් ප්‍රතිපාදන ඇමුණුම 2 හි සඳහන් වේ.

## 06. අලෙවිකරණ දැනුම වර්ධනය කිරීමේ දෙදින පුහුණු වැඩසටහන

සාර්ථක ව්‍යාපාරික ප්‍රජාවක් බිහිකිරීම සඳහා ව්‍යවසායකයින්ගේ ව්‍යාපාරික ඥානය, අලෙවිකරණ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම මෙන්ම නව වෙළඳපොල අවස්ථා හඳුනාගැනීමට අවශ්‍ය මගපෙන්වීම නිරතුරුවම ලබාදිය යුතු වේ. මේ සඳහා දැනුම අවශ්‍ය ව්‍යාපරික ප්‍රජාව හඳුනාගෙන පහත සඳහන් අංශ යටතේ දැනුම ලබාදීමේ දෙදින පුහුනු වැඩසටහනක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසුම් කළයුතු අතර ඒ සඳහා රු. 40,000/- උපරිමයකට යටත්ව දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වෙන් කර දෙනු ලැබේ.

**<u>පුහුණුලාභීන් තෝරා ගැනීම.</u>**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ විසිරි සිටින අඩු ආදායම්ලාභි මෙන්ම දිවිනැගුම ව්‍යාපාරිකයින් 50 ක ගෙන් සමන්විත කණ්ඩායමක් මේ සඳහා තෝරා ගැනීම.

**<u>පුහුණු අන්තර්ගතය</u>**

**පළමු දිනය**

- පාරිභෝගික සබඳතා පවත්වාගෙන යාම හා ප්‍රවර්ධනය කර ගැනීම.
- දක්ෂ ව්‍යවසායකයකු සතු ගුණාංග
- නිෂ්පාදන තාක්ෂණය/ප්‍රමිතිකරණය හා ප්‍රචාරණය
- වෙළෙඳපොල ජයගත් ව්‍යවසායකයකුගේ අත්දැකීම්

**දෙවන දිනය**

- ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාව - පෙ.ව 8.00 - ප.ව.4.00

**<u>පුහුණු ඇස්තමේන්තුව</u>**

| **පළමු දිනය** | | |
|---|---|---|
| **අනු අංකය** | **අයිතමය** | **මිල රුපියල්** |
| 01 | අහාරපාන සඳහා (උදේ/සවස තේ හා දිවා ආහාර) (50X250) | 12,500.00 |
| 02 | සම්පත්දායක දීමනා (පැයකට රු.500/- බැගින්) | 3,000.00 |
| 03 | ලිපි ද්‍රව්‍ය | 2,500.00 |
| **මුළු වියදම** | | **18,000.00** |

| දෙවන දිනය | | |
|---|---|---|
| අනු අංකය | අයිතමය | මිල රුපියල් |
| 01 | ක්ෂේත්‍ර චාරිකාව (සංග්‍රහ වියදම්, ප්‍රවාහන) | 25,000.00 |
| 02 | වෙනත් | 2,000.00 |
| මුළු වියදම | | **27,000.00** |

**<u>සම්පත්දායකයින් තෝරා ගැනීම.</u>**

- ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා වානිජ මණ්ඩලය
- කුඩා ව්‍යාපාර සංවර්ධන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- විදාතා මධ්‍යස්ථානය

වැනි ආයතනවල ඉහත විෂයන් පිළිබඳ ප්‍රවීනයන්ගෙන් යුත් සම්පත්දායක මඩුල්ලකගේ සම්පත්දායකත්වය ලබා ගැනිමට සැලකිළිමත් විය යුතු අතර ඒ සඳහා ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශය ද අවශ්‍ය වේ.

වෙළඳපල ජයගත් ව්‍යවසායකයකුගේ අත්දැකිම් පුහුණු සැසියට එක් කිරීමේදි ඔබගේ දිස්ත්‍රික්කයේ /ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපාරිකයකුගේ අත්දැකිම් ලබාදීමට සැලසුම් කිරිම කාලෝචිතය.

එසේම දෙවන දින සිදුකරන කේෂ්ත්‍ර නිරික්ෂණයට එම අයගේම ව්‍යාපාරය නිරික්ෂණය කිරිමට ඉඩකඩ සැලසෙන පරිදි පුහුණු වැඩසටහන සැලසුම් කිරිම වඩාත් ඵලදායි වනු ඇත.

# ව්‍යාපෘති කාල රාමුව

| | ක්‍රියාකාරකම | කාලය | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජුනි | | | | ජුලි | | | | අගෝස්තු | | | | සැප්තැම්බර් | | | | ඔක්තෝබර් | | | | නොවැම්බර් | | | | දෙසැම්බර් | | | |
| 01 | චක්‍රලේඛය පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 02 | ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් හඳුනාගැනීම හා ප්‍රජාමූල සංවිධාන/සමිතිවල සම්මත කිරීම | | | | | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | | | | | | | | | | |
| 03 | ව්‍යාපෘති වාර්තා සකස් කිරීම/නිර්දේශ කිරීම හා අනුමත කිරීම | | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | | | | | | | | | | | | | | | |
| 04 | අග්‍රිම ඉල්ලීම | | | | | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | | | | | | | |
| 05 | ව්‍යාපෘති ආරම්භ කිරීම හා නිම කිරීම | | | | | | | | | | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | | | | |
| 06 | පසු විපරම හා ප්‍රගති පාලනය | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ | ■ |

**<u>පොදු උපදෙස්</u>**

I. 2016 වසරේ අලෙවි සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිමට එක් එක් දිස්ත්‍රික්කය සඳහා වෙන් කර ඇති දෙපාර්තමේන්තු ප්‍රතිපාදන සීමාවන් හා ව්‍යාපෘති ඉලක්ක ඇමුණුම 01 මගින් දක්වා ඇත. එකී ඉලක්ක සම්පූර්ණ කිරීම සඳහා අවධානය යොමුකළ යුතු වේ.

II. ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභින් තෝරා ගැනිම,ව්‍යාපෘති මෙහෙයවීම, පසුවිපරම් කිරීම, ඇගයීම, ප්‍රගතිය වාර්තා කිරීම සම්බන්ධයෙන් දිවිනැගුම දෙපාර්තමේන්තුව විසින් 2016.05.16 දින නිකුත් කර ඇති DDD/HO/08/pm/05/Prog.rep අංක දරණ ලිපියේ උපදෙස් අනුගමනය කිරීමට වගබලා ගත යුතු වේ.

III. තනි පුද්ගල වශයෙන් ක්‍රියාත්මක කරන අලෙවි ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබාදීමේදී අදාල ප්‍රතිලාභියා සමග ගිවිසුමකට එළඹීම කාලෝචිත වේ. ව්‍යාපෘතිය ඵලදායීව ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යෑම මෙන්ම ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන එම ව්‍යාපාතිය සඳහාම වැය කිරීමේ වගකීම සම්බන්ධයෙන් දිවිනැගුම සංවර්ධන නිලධාරී, දිවිනැගුම කළමනාකරු, ව්‍යාපෘති කළමනාකරුගේ අධික්ෂණය, මගපෙන්වීම හා සුපරික්ෂණය අත්‍යාවශ්‍ය වේ.

IV. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල හඳුනාගන්නා අලෙවි සංවර්ධන ව්‍යාපෘති ලේඛනය ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සමග අනුමැතිය සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කර

ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතු වේ. දිස්ත්‍රික් ලේකම් විසින් තම දිස්ත්‍රික්කයට අදාල ව්‍යාපෘති අනුමත කර අවශ්‍ය අග්‍රිම ලබාගැනීම සඳහා දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල් වෙත ඇමුණුම අංක 05 මගින් ඉල්ලීම් කළයුතු වේ.

එසේම මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මාස 5ක් වැනි කෙටි කාලයක් පමණක් ඉතිරි වී ඇති බැවින් ඔබගේ විශේෂ අවධානය යොමුකර ඔබ දිස්ත්‍රික්කයේ අලෙවි ව්‍යාපෘති ආරම්භ කිරීමට අවශ්‍ය විධිවිධාන කඩිනම් සිදු කර අග්‍රිම ඉල්ලුම් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

මෙම චක්‍රලේඛනය පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් 0112887013 දරණ දුරකථන අංකය මගින් හෝ marketing@divineguma.gov.lk විද්‍යුත් තැපැල මගින් අමතන්නනේ නම් මැනවි.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

**පිටපත්:-**

1. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
2. අතිරේක ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
3. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
4. ප්‍රධාන ගණකාධිකාරී, දිවිනැගුම දෙපාර්තමේන්තුව - අ.ක.ස
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අ.ක.ස
6. සියළුම අංශ ප්‍රධානින් - අ.ක.ස